# 1935 හේ වෘත්තිය සමිති නියෝග

ලුහුඩු නාමය.

1. මෙම නියෝග, 1935හේ වෘත්තිය සමිති නියෝග ලෙස හැඳින්විය හැකිය.

ලේඛන පොත.

2. 7 වෙනි වගන්තියෙන් වුවමනා වන වෘත්තිය සමිති ලේඛන පොත් "අ" ආකෘතියට සාරානුකූලව තිබිය යුතුය. තවද එම ආකෘතියෙහි දැක්වෙන විස්තර එහි ඇතුළත් විය යුතුය.

ලියා පදිංචි කිරීමට ඉල්ලීම.

3. වෘත්තිය සමිතියක් ලියා පදිංචි කිරීම සඳහා, 9 වෙනි වගන්තියෙහි (1) වෙනි උපවගන්තිය යටතේ කරන සෑම ඉල්ලීමක ඉල්ලුම් පත්‍රයක්ම "ආ" ආකෘතියට සාරානුකූල විය යුතුය.

වත්කම හා ණය පිළිබඳ සටහන.

4. 9 වෙනි වගන්තියෙහි (3) වෙනි උපවගන්තියෙහි සඳහන් වෘත්තිය සමිතියක වත්කම හා ණය පිළිබඳ සාමාන්‍ය සටහන "ඉ" ආකෘතියට සාරානුකූලව පිළියෙළ කළ යුතුය. තවද එම ආකෘතියෙහි දැක්වෙන විස්තර එහි ඇතුළත් විය යුතුය.

ලියා පදිංචි කළ යුතු ක්‍රමය.

5. වෘත්තිය සමිතියක් ලියා පදිංචි කරනු ලබන්නේ "අ" ආකෘතියෙන් නියමිත සියලු විස්තර ලේඛන පොතෙහි සටහන් කිරීමෙනි. එම සටහන පිළිගනිමින් වෘත්තිය සමිති ලේකම් තැන විසින්ද අත්සන් කළ යුතුය. ලේඛන පොතෙහි සෑම වෙනස් කිරීමක හෝ සංශෝධනයක වෘත්තිය සමිති ලේකම් තැනගේ කෙටි අත්සනද තිබිය යුතුය.

ලියා පදිංචි කිරීමේ සහතික පත්‍රය.

6. 11 වෙනි වගන්තිය යටතේ වෘත්තිය සමිති ලේකම් තැන විසින් නිකුත් කරන සහතික පත්‍රය "ඊ" ආකෘතියට සාරානුකූලව විය යුතුය.

සහතිකපත්‍රය අවලංගු කිරීම හෝ අස්කරගැනීම හෝ පිළිබඳ ඉල්ලුම් පත්‍රය.

7. (1) 15 වෙනි වගන්තියෙහි (1) වෙනි උපවගන්තියෙහි (අ) ඡේදය යටතේ, ලියා පදිංචි කරන ලද වෘත්තිය සමිතියක ලියා පදිංචි කිරීම අවලංගු කිරීම සඳහා හෝ අස්කිරීම සඳහා හෝ කරන සෑම ඉල්ලීමක ඉල්ලුම් පත්‍රයක්ම "උ" ආකෘතියට සාරානුකූල විය යුතුවත් හැර සමිතියේ ලේකම් තැන විසින් සහ සමිතියෙහි සාමාජිකයන්ගෙන් හත් දෙනෙකුට අඩු නොවන සංඛ්‍යාවක් විසින් එහි අත්සන් තැබිය යුතුවේ. තවද සමිතියට මුද්‍රාවක් ඇත්නම් එයද එහි තැබිය යුතුය.

(2) තමන් හොඳාකාරම දන්නා ලෙසත් විශ්වාස කරන ලෙසත් එම ඉල්ලුම් පත්‍රයේ සඳහන් ප්‍රකාශ සත්‍ය බවට, ලේකම් තැන විසින් සහ සමිතියේ සාමාජිකයන් විසින් අත්සන් කරන ලද සහතික පත්‍රයක්, එබඳු සෑම ඉල්ලුම් පත්‍රයකටම ඇමිණිය යුතුය.

සාක්ෂි කැඳවීමට වෘත්තිය සමිති ලේකම් තැනම් ඇති බලය.

8. වෘත්තිය සමිතියක් ලියා පදිංචි කිරීම අවලංගුකිරීමක් හෝ අස්කිරීමක් පිළිබඳ ඉල්ලුම් පත්‍රයක් වෘත්තිය සමිති ලේකම් තැනට ඉදිරිපත් කළ කල්හි, එම සමිතිය විසින් එම ඉල්ලුම් පත්‍රය යැවීමට යථා පරිදි බලය නොදෙන ලදැයි විශ්වාස කිරීමට ඔහුට කාරණා ඇත හොත්, කරුණු දැනගැනීම සඳහා අවශ්‍ය යයි හැඟෙන සාක්ෂි ඉල්ලුම්කරුවන්ගෙන් ලබාගැනීමට ද, එබඳු සමිතියක නිලධාරින් යම් කිසිවෙකුගෙන් විභාග කිරීමට ද ඔහුට බලය...

ලියා පදිංචි කිරීම අස්කර ගැනීමහෝ අවලංගු කිරීමට හෝ දැන්වීම.

9. 15 වෙනි වගන්තියේ (1) වෙනි උපවගන්තියෙහි (ආ) ඡේදය යටතේ වෘත්තිය සමිතියක සහතික පත්‍රයක් අස්කර ගැනීමට හෝ අවලංගු කිරීමට වෘත්තිය සමිති ලේකම් තැන විසින් අදහස් කර සිටින විට ඔහු විසින් " ඌ " ආකෘතියට සාරානුකූල දැන්වීමක් වෘත්තිය සමිතිය වෙත භාර කරවිය යුතුය.

සහතික පත්‍රය භාර දීම.

10. 15 වෙනි වගන්තියේ (1) වෙනි උපවගන්තියෙහි (අ) හෝ (ආ) ඡේදයන් යටතේ වෘත්තිය සමිතියක් ලියා පදිංචි කිරීමේ සහතික පත්‍රයක් අස්කර ගැනීමට හෝ අවලංගු කිරීමට වෘත්තිය සමිති ලේකම් තැන විසින් තීරණය කළ විට, 6 වෙනි නියෝගය යටතේ එම වෘත්තිය සමිතියට නිකුත් කරන ලද ලියා පදිංචි කිරීමේ සහතික පත්‍රය එම සමිතියේ ලේකම් තැන විසින් වෘත්තිය සමිති ලේකම් තැනට භාර දිය යුතුය.

නම වෙනස් කිරීමේ දැන්වීම.

11. (1) 29 වෙනි වගන්තියේ (1) වෙනි උපවගන්තිය යටතේ දෙනු ලබන ලියා පදිංචි කරන ලද වෘත්තිය සමිතියක නම වෙනස් කිරීමේ දැන්වීම " එ " ආකෘතියට සාරානුකූල විය යුතුය.

(2) 29 වෙනි වගන්තියේ (3) වෙනි උපවගන්තිය යටතේ වෘත්තිය සමිති ලේකම් තැන විසින් නම් වෙනස් කිරීමක් ලියා පදිංචි කරන විට, 6 වෙනි නියෝගය යටතේ නිකුත් කරන සහතික පත්‍රයෙහි පහත තමාගේ අත්සන යොදා, අළුත් නම ලියා පදිංචි කළ බවට, සහතික කළ යුතුය. මෙම කාර්‍ය්‍ය සඳහා සමිතියේ ලේකම් තැන විසින් වෘත්තිය සමිති ලේකම් තැන වෙත සහතික පත්‍රය ඉදිරිපත් කළ යුතුය.

ඒකාබද්ධ කිරීමේ දැන්වීම.

12. (1) 29 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තිය යටතේ වෘත්තිය සමිති ඒකාබද්ධ කිරීමේ සෑම දැන්වීමක්ම " ඒ " ආකෘතියට සාරානුකූලව විය යුතුය.

ඒකාබද්ධ සමිති ලියා පදිංචි කිරීම.

(2) 29 වෙනි වගන්තියේ (4) වෙනි උපවගන්තිය යටතේ ඒකාබද්ධ කරන ලද වෘත්තිය සමිතියක් ලියා පදිංචි කළ විට " අ " ආකෘතියෙහිවූ ලේඛන පොතෙහි ඒ සඳහා අළුත් අංකයක් වෙන් කළ යුතුය. ඒ සඳහා වෘත්තිය සමිති ලේකම් තැන විසින් " ඊ " ආකෘතිය ප්‍රකාර අළුත් සහතික පත්‍රයක්ද නිකුත් කළ යුතුය. තවද, ලේඛන පොතෙහි, මෙලෙස ඒකාබද්ධ කරනලද වෘත්තිය සමිති සම්බන්ධයෙන් සටහනක් වෙනොත් එය කෙළින් ඒකාබද්ධ කිරීමද ඔහු විසින් සඳහන් කළ යුතුය.

විසුරුවා හැරීමේ දැන්වීම.

13. (1) ලියා පදිංචි කරන ලද වෘත්තිය සමිතියක් විසුරුවා හැරි විට, 34 වෙනි වගන්තිය යටතේ වූ විසුරුවා හැරීමේ දැන්වීම " ඔ " ආකෘතියට සාරානුකූලව වෘත්තිය සමිති ලේකම් තැන වෙත යැවිය යුතුය.

(2) 34 වෙනි වගන්තිය යටතේ වූ විසුරුවා හැරීමේ දැන්වීමත් සමගම ලේකම් තැන විසින් 6 වෙනි නියෝගය යටතේ නිකුත් කරන ලද සහතික පත්‍රයක් භාර දිය යුතුය. වෘත්තිය සමිති ලේකම් තැන විසින් විසුරුවා හැරීම ලියා පදිංචි කළ විට එම ලියා පදිංචි කිරීම එම වෘත්තිය සමිතියේ ලේකම් තැනට ඔහුගේ අත්සනින් යුත් දැන්වීමකින් දැන්විය යුතුය.

කාර්‍ය්‍යාලය වෙනස් කිරීමේ දැන්වීම.

14. 31වෙනි වගන්තියේ (2) වෙනි උප වගන්තිය යටතේ වෘත්තිය සමිතියක ලියා පදිංචි කරන ලද කාර්‍ය්‍යාලයෙහි පිහිටීමේ වෙනසක් දැනුම්දීම " [illegible] " [illegible]

15. (1) 32වෙනි වගන්තියේ (3) වෙනි උපවගන්තිය යටතේ වෘත්තීය සමිතියක එවකට පවත්නා ව්‍යවස්ථා වෙනස් කිරීමක් ලියා පදිංචි කිරීමට හෝ අළුත් ව්‍යවස්ථාවක් ලියා පදිංචි කිරීමට හෝ වෘත්තීය සමිති ලේකම් තැනගෙන් ඉල්ලන ඉල්ලුම් පත්‍රය "ක" ආකෘතියට සාරානුකූලව විය යුතුය. ඉල්ලුම් පත්‍රය ලේකම් තැන විසින් අත්සන් කළ යුතුය.

ව්‍යවස්ථා කිරීමේ

(2) අළුත් ව්‍යවස්ථා ලියා පදිංචිකිරීමට හෝ පවත්නා ව්‍යවස්ථා වෙනස් කිරීම් ලියා පදිංචි කිරීමට හෝ ගෙවිය යුතු ගාස්තුව නම් එකවිටම ලියා පදිංචි කරන ව්‍යවස්ථා හෝ ව්‍යවස්ථා වෙනස් කිරීම් එක පංතියකට ශත විසිපහක් බැගිනි. එම මුදල ඉල්ලුම් පත්‍රය සමග අවලංගු නොකරන ලද මුද්දරවලින් යැවිය යුතුය.

16. (1) ලියා පදිංචි කරන ලද වෘත්තීය සමිතියක සෑම නිලධාරියෙකු ගේම වෙනස් කිරීමක හෝ යම්කිසි නිලධාරියෙකුගේ පදවිය වෙනස් කිරීමක හෝ දැන්වීම 33 වෙනි වගන්තිය යටතේ "ග" ආකෘතියට සාරානුකූලව වෘත්තීය සමිති ලේකම් තැනට දිය යුතුය.

නිලධාරීන් කිරීමේ දැන්

(2) දැන්වීමේ ප්‍රකාර ලේඛන පොතෙහි සටහන් නිවැරදි කිරීම සඳහා එකවිට කරන නිවැරදි කිරීම් පංතියකට ශත දහය බැගින් ගාස්තුව ගෙවිය යුතුය. එම මුදල දැන්වීමත් සමගම අවලංගු නොකරන ලද මුද්දරවලින් යැවිය යුතුය.

17. භාණ්ඩාගාරික තැන විසින් හෝ ගණුදෙනු පිළිබඳව වගකිව යුතු වෙනත් නිලධාරියෙකු විසින් හෝ ලියා පදිංචි කරන ලද වෘත්තීය සමිතියකට 43 වෙනි වගන්තිය යටතේ ඉදිරිපත් කළ යුතු ගණුදෙනු "ජ" ආකෘතියට සාරානුකූල විය යුතුය.

භාණ්ඩාගාරි තැන විසින් පත් කළ යු දෙනු ලේඛ

18. 44 වෙනි වගන්තියේ (1) වෙනි උපවගන්තිය යටතේ වන සාමාන්‍ය ලේඛනය එක් එක් අවුරුද්දෙහි ජුනි මස 30 වෙනි දින හෝ ඊට පෙර වෘත්තීය සමිති ලේකම් තැනට "ට" ආකෘතියට සාරානුකූලව යැවිය යුතුය. එම ආකෘතියෙහි සඳහන් කිරීමට ඉඩ හැර තිබෙන සියලු විස්තර එහි ඇතුළත් කළ යුතුය.

වාර්ෂික වාර්

19. ගණුදෙනු පරීක්ෂා කළ අවුරුද්ද ඇතුළතදී ලියා පදිංචි කරන ලද වෘත්තීය සමිතියකට අයිති අරමුදල් වලින් හෝ ඇප මුදල්වලින් හෝ කොටසක් භාරව සිටිය කිසිවෙක් එම අවුරුද්දෙහි එම සමිතියෙහි ගණුදෙනු පරීක්ෂා කිරීමට සුදුසු නොවන්නේය,

පරීක්ෂකවරු නුසුදුසුවීම.

20. වෘත්තීය සමිති ගණුදෙනු බැලීම පිණිස, වෘත්තීය සමිති ලේකම් තැනගේ අනුමතිය ඇති පත් කරන ලද පරීක්ෂක තැන හෝ පරීක්ෂකවරුන් විසින් වාර්ෂික වාර්තාව, එයට සම්බන්ධ වූ ගණුදෙනු සහ වැය සහතිකයන් සමග, නිවැරදිදැ යි සලකා බැලිය යුතුය. ඊට පසුව "ජ" ආකෘතියට අමුණා තිබෙන, පරීක්ෂකතැනගේ ප්‍රකාශයෙහි අත්සන් තැබිය යුතුය. එම වාර්තාව ඔහුට හෝ ඔවුන්ට නිවැරදි බවට පෙනී ගියේ කුමන කරුණක් නිසාද යන්න ද වැය සහතික පත්‍රවලින් වියදම් සහතික නොකොට තිබුණ නිසාද නැත හොත් ආඥාපනත අනුව නොවන නිසාද යන්නද තම අත්සන යට එම ආකෘතියෙහි ප්‍රකාශයකින් වෙන්වම දක්විය යුතුය.

ගණන් කළ යුතු ආ

එම ප්‍රකාශයේ පහත දැක්වෙන කරුණුවල විස්තර තිබිය යුතුය :—

(අ) වෘත්තීය සමිතියේ ව්‍යවස්ථාවලින් බලය නුදුන් ලෙස හෝ පනතෙහි

(ආ) යමෙකුගේ නොසැලකිල්ල නිසා හෝ අනිසි හැසිරීම නිසා හෝ අඩුවූ නැතහොත් අලාභවූ මුදලක ප්‍රමාණය; සහ

(ඉ) යමෙකු විසින් ගණුදෙනු පෙන්විය යුතුවූ නමුත් එසේ නොපෙන්වන ලද මුදලක ප්‍රමාණයද වේ.

දේශපාලන අරමුදල පරීක්ෂා කිරීම.

21. ලියා පදිංචි කරන ලද වෘත්තිය සමිතියක දේශපාලන අරමුදල පරීක්ෂා කිරීම, සමිතියේ සාමාන්‍ය ගණුදෙනු පරීක්ෂා කිරීමත් සමගම එම පරීක්ෂක තැන විසින් හෝ පරීක්ෂකවරුන් විසින් හෝ කළ යුතුය.

දේශපාලන අරමුදලක් ඇති කිරීමට ඡන්දය දිය යුතු ආකාරය.

22. (1) 41 වෙනි වගන්තියේ (3) වෙනි උපවගන්තියෙන් නියමිත ඡන්දය ගැනීම පහත දැක්වෙන පිළිවෙළට කළ යුතුය. සමිතිය විසින් යතුරක් සහිත යතුරු තහඩුවක් සවි කරන ලද පෙට්ටියක් සපයා තැබිය යුතුය. ඡන්දය ගැනීමට ප්‍රථම, රැස්වීමෙහි මූලාසනය දරන තැනැත්තා විසින් ඡන්ද පෙට්ටිය හිස් බව පෙන්නුම් කොට, යතුරු ද, රැස්වීමෙහි අයට පෙනෙන සුදුසු තැනෙක තැබිය යුතුය. ඉක්බිති ඔහු විසින් ඡන්දය දීම ආරම්භවූ බැව් ප්‍රකාශ කොට ඡන්දය දීමට කැමති, පැමිණ සිටින සෑම සාමාජිකයාටම සිංහලෙන් හෝ දෙමළෙන් හෝ වූ පහත දැක්වෙන ආකෘතිය ප්‍රකාර ඡන්ද පත්‍රිකාවක් නිකුත් කළ යුතුය. එම සාමාජිකයා විසින් තමන් කැමති කාරණය ඉදිරිපිට ලකුණක් කොට පත්‍රිකාව නමා ඡන්ද පෙට්ටියේ තැන්පත් කළ යුතුවේ. ඡන්ද පත්‍රිකාව ලකුණු කරන්නේ කෙලෙසද යනු යමෙකුට දැන ගැනීමට නොහැකි වනසේ තමාගේ ඡන්ද පත්‍රිකාව ලකුණු කළ හැකි අන්දමේ සුදුසු තැනක් සෑම සාමාජිකයෙකුටම පිළියෙළ කර දිය යුතුය. ඡන්දය දීමට කැමති, පැමිණ සිටි සෑම සාමාජිකයෙකුගේම ඡන්දය සටහන් කළ පසු, මූලාසනයේ සිටි තැනැත්තා විසින් ඡන්ද විමසීම අවසාන බැව් ප්‍රකාශ කළ යුතුය. ඊට පසු රැස්ව සිටින්නන් ඉදිරිපිටදී ඡන්ද පෙට්ටිය විවෘත කොට එක් එක් කාරණය සම්බන්ධයෙන් පක්ෂව දී තිබෙන ඡන්ද පත්‍රිකා ගණන් කළ යුතුය. එවිට ඡන්ද විමසීමේ ප්‍රතිඵල රැස්ව සිටින අයට ප්‍රකාශ කළ යුතුවේ.

රැස්වීමට පැමිණ සිටි යම් සාමාජිකයෙක් නැවත ගණන් කිරීමක් ඉල්ලා සිටියහොත්, මූලාසනයෙහි සිටි තැනැත්තා විසින් එක් එක් කාරණය සම්බන්ධයෙන් පක්ෂව දී තිබුණු ඡන්ද පත්‍රිකා නැවත ගණන් කොට එහි ප්‍රතිඵලය කලින් ගණන් කිරීම සමග නිවැරදිද යි සසඳා බැලිය යුතුය.

(2) සමිතියෙහි ලේකම් තැන විසින් ඡන්ද විමසීමේ ප්‍රතිඵල රැස්වීම පවත්වා දින 7ක් ඇතුළතදී වෘත්තිය සමිති ලේකම් තැනට දන්වා යැවිය යුතුය.

ඉහත සඳහන් කරන ලද ආකෘතිය.

වෘත්තිය සමිතියේ දේශපාලන අරමුදලක් ඇති කිරීමට ඔබ පක්ෂද?

| | |
|---|---|
| ඔව් | |
| නැහැ | |

23. පනතින් හෝ මෙම නියෝගයන්ගෙන් හෝ වෘත්තීය සමිති ලේකම් තැන විසින් අත්සන් කිරීමට හෝ ඔහුගේ කෙටි අත්සන තැබීමට වුවමනා වන ආකෘති, දැන්වීම හෝ ආඥා, වෘත්තීය සමිති ලේකම් තැනට හෝ ලියවිල්ලකින් හා ගැසට් පත්‍රයේ දැන්වීමකින් ඒ සඳහා පත් කරන ලද නිලධාරියෙකුට හෝ ඔහු වෙනුවට හා ඔහුගේ නියමය පිට අත්සන් කිරීමට පිළිවන, නැතහොත් ඒවායේ කෙටි අත්සන තැබීමට පිළිවන. වෘත්තීය සමිති ලේකම් තැන වෙනුවෙන් අත්සන් කිරීම.

24. ලියා පදිංචි කරන ලද වෘත්තීය සමිතියක් වෙත දීමට හෝ භාර කරවීමට, පනතින් හෝ මෙම නියෝගයන් ගෙන් වුවමනා වන දැන්වීමක්, ආඥාවක් හෝ වෙනත් දැන්විය යුතු දෙයක් පුද්ගලිකව එම සමිතියේ ලේකම් තැන වෙත භාර දීම නැතහොත් සමිතියේ ලේකම් තැන වෙත එම සමිතියේ ලියා පදිංචි කරන ලද කාර්යාලයට රෙජිස්ටර් තැපෑලෙන් යැවීම, නියම ලෙස දීමක් නැතහොත් භාර දීමක් ලෙස සලකනු ලැබේ. දැන්වීමක් හෝ ආඥාවක් භාර කරවන ක්‍රමය.

25. (1) 7 වෙනි වගන්තිය ප්‍රකාර වෘත්තීය සමිති ලේකම් තැන විසින් තැබිය යුතු වෘත්තීය සමිති ලේඛන පොත ශත 50ක ගාස්තුවක් ගෙවීමෙන්, කාර්යාල වේලාවල යමෙකුට පරීක්ෂා කර බැලීමට ඉඩ හැර තැබිය යුතුය. ලේඛන පොත සහ ලියවිලි පරීක්ෂා කිරීම.

(2) ලියා පදිංචි කරන ලද වෘත්තීය සමිතියකින් ලබා ගන්නා ලදුව, වෘත්තීය සමිති ලේකම් තැන භාරයේ තිබෙන ලියවිලි, සාමාජිකයෙකු විසින් පරීක්ෂා කිරීමට වුවමනා එක ලියවිල්ලකට ශත 10 බැගින් ගාස්තුවක් ගෙවීමෙන් කාර්යාල වේලාවලදී බැලීමට පිළිවන.

(3) (1) වෙනි සහ (2) වෙනි ඡේදවල සඳහන් ගාස්තු, වෘත්තීය සමිති ලේකම් තැන වෙත ලියා යවන ඉල්ලුම් පත්‍රයෙහි අලවන ලද අවලංගු නොකළ මුද්දර මාර්ගයෙන් ගෙවිය යුතුය.

## " ඇ " ආකෘතිය

(7 වෙනි වගන්තිය සහ 2 වෙනි නියෝගය)

## වෘත්තිය සමිති පනත

### වෘත්තිය සමිති ලේඛන පොත

1. ලියා පදිංචි කිරීමේ අංකය ... ... ...
2. ලියා පදිංචි කිරීමේ දිනය ... ... ...
3. (අ) ඉල්ලීම කරන සාමාජිකයින්ගේ නම් ...
   (ආ) ඉල්ලීම කරන සාමාජිකයින්ගේ රක්ෂාවල් ...
   (ඉ) ඉල්ලීම කරන සමාජිකයින්ගේ ලිපින ... ...
4. වෘත්තිය සමිතියේ නම ... ... ...
5. වෘත්තිය සමිතියේ ප්‍රධාන කාර්යාලයේ ලිපිනය ...
6. වෘත්තිය සමිතිය පිහිටුවන ලද දිනය ... ...
7. වෘත්තිය සමිතියෙහි නිලධාරීහු—
   ධුරය :
   නම :
   *වයස :
   රක්ෂාව :
   ලිපිනය :
8. වෘත්තිය සමිති ලේකම් තැනගේ අත්සන ... ...
9. (අ) 41 වෙනි වගන්තිය යටතේ වෙනම අරමුදලක් සඳහා විධිවිධාන යොද තිබේද? එසේ යොද තිබේ නම් ඒ කවර දිනක සිටද? ... ... ...
   (ආ) වෘත්තිය සමිති ලේකම් තැනගේ කෙටි අත්සන ...
10. (අ) ව්‍යවස්ථා වෙනස් කිරීම දන්වූ දිනය ... ...
    (ආ) ව්‍යවස්ථා වෙනස් කිරීම ලියා පදිංචි කළ දිනය සහ ඒ බව වෘත්තිය සමිතියෙහි ලේකම් තැනට දන්වූ දිනය ... ... ...
    (ඉ) වෘත්තිය සමිති ලේකම් තැනගේ කෙටි අත්සන ...
11. (අ) ලියා පදිංචි කරන ලද කාර්යාලයේ ලිපිනය වෙනස්වීම ලියා පදිංචි කළ දිනය ... ...
    (ආ) වෙනස් කිරීමෙන් පසු වෘත්තිය සමිතියෙහි ලිපිනය
    (ඉ) වෘත්තිය සමිති ලේකම් තැනගේ කෙටි අත්සන ...
12. (අ) නම වෙනස් කිරීම ලියා පදිංචි කළ දිනය ...
    (ආ) වෙනස් කිරීමෙන් පසු වෘත්තිය සමිතියෙහි ලිපිනය
    (ඉ) වෘත්තිය සමිති ලේකම් තැනගේ කෙටි අත්සන ...
13. (අ) නිලධාරීන්ගේ වෙනස්වීම් හෝ යම් නිලධාරියකුගේ ධුරය වෙනස්වීම ලියා පදිංචි කළ දිනය ...
    (ආ) වෙනස් කිරීමෙන් පසු නිලධාරීන්ගේ නම් හෝ නිලධාරීන්ගේ ධුර ... ...
    (ඉ) වෘත්තිය සමිති ලේකම් තැනගේ කෙටි අත්සන ...
14. (අ) ඒකාබද්ධ කිරීම ලියා පදිංචි කළ දිනය ...
    (ආ) ඒකාබද්ධ කළ සමිතියේ නම ... ...
    (ඉ) ඒකාබද්ධ කළ සමිතියේ ලිපිනය ... ...
    (ඊ) ඒකාබද්ධ කළ සමිතිය ලියා පදිංචි කළ අංකය ...
    (උ) වෘත්තිය සමිති ලේකම් තැනගේ කෙටි අත්සන ...
15. (අ) 15වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙහි (අ) ඡේදය යටතේ ලියා පදිංචි කිරීම අවලංගු කිරීමට ඉල්වූ දිනය ... ... ...
    (ආ) 15 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙහි (ආ) ඡේදය යටතේ අවලංගු කිරීමට හෝ අස්කර [illegible]

(ඉ) ලියා පදිංචි කිරීම අස්කර ගැනීමට හෝ අවලංගු කිරීමට කරනු ලැබූ නියමය නිකුත් කළ දිනය ...

(ඊ) වෘත්තීය සමිති ලේකම් තැනගේ කෙටි අත්සන ...

16. (අ) විසුරුවා හැරීම ඉල්ලන සාමාජිකයින්ගේ නම ...

(ආ) විසුරුවා හැරීම ඉල්ලන සාමාජිකයින්ගේ රක්ෂාවල්

(ඉ) විසුරුවා හැරීම ඉල්ලන සාමාජිකයින්ගේ ලිපින

(ඊ) විසුරුවා හැරීම ලියා පදිංචි කළ දිනය සහ ඒ සඳහා සහතික පත්‍රය නිකුත් කළ දිනය ... ...

(උ) වෘත්තීය සමිති ලේකම්තැනගේ කෙටි අත්සන ..

සැලකිය යුතුයි.—ඉහත දක්වුණු විස්තර එක් වෘත්තීය සමිතියකට, ලේඛන පොතෙහි වෙන් කර තිබෙන පිටු එකක හෝ ඊට වැඩි ගණනක ඇතුළත් කළ හැකිවේ.

---

"ස" ආකෘතිය

(9 වෙනි වගන්තිය සහ 3 වෙනි නියෝගය)

**වෘත්තීය සමිති පනත**

**වෘත්තීය සමිති ලියා පදිංචි කිරීමේ ඉල්ලුම් පත්‍රය**

| |
|---|
| රුපියල් 1 මුද්දරය අවලංගු නොකළ යුතුය. |

වෘත්තීය සමිති පිළිබඳ ලේකම් තැන වෙතය, කොළඹ.

වෘත්තීය සමිතියෙහි නම : ———.

ලිපිනය : ———.

19——. ක්‍රි. ව. ——— මස ——— වෙනි දින දිය.

1. මෙම ඉල්ලීම කරන්නේ මෙහි පහත අත්සන් කර තිබෙන අය විසිනි.

2. ———වෘත්තීය සමිතිය පටන් ගනු ලැබූයේ 19— ක්‍රි. ව. ——— මස ——— වෙනි දින දිය.

3. සමිතිය ——— කර්මාන්තයෙහි හෝ ——— වෘත්තියෙහි හෝ ——— (ආයතනයෙහි) යෙදුනු සේවයෝජකයන්ගේ සේවකයන්ගේ සමිතියකි. තවද එහි සාමාජිකයන් ———දෙනෙක් සිටිත්.

4. මෙම ඉල්ලුම් පත්‍රයට රුපියලක වටිනාකමැති අවලංගු නො කරන ලද මුද්දරයක්/මුද්දර අමුණා ඇත.

5. පනතෙහි 9 වෙනි වගන්තියේ (2) වෙනි උපවගන්තියෙන් නියම කරන විස්තර ලේඛනය මෙම ඉල්ලුම් පත්‍රයට අමුණන ලද I වෙනි උපලේඛනයෙහි දක්වෙයි.

6. පනතෙහි 9 වෙනි වගන්තියේ (3) වෙනි උපවගන්තියෙන් නියම කරන* වත්කම් හා ණය පිළිබඳ සාමාන්‍ය සටහන II වෙනි උපලේඛනයෙහි දක්වෙයි.

7. මෙම ඉල්ලුම් පත්‍රයට, සමිතියෙහි ව්‍යවස්ථාවන්ගේ පිටපතක්† අමුණා ඇත.

8. මෙම පනතෙහි 32 වෙනි වගන්තියේ පෙන්වා තිබෙන කාරණා සඳහා ව්‍යවස්ථාවලින් සලසන ලද විධිවිධාන, III වෙනි උපලේඛනයෙහි දක්වෙන විස්තරවලින් පෙන්නුම් කරනු ලැබේ.

9. වෘත්තීය සමිති වෙනුවෙන් මෙම ඉල්ලීම කිරීමට එම සමිතිය විසින් අපට යථාපරිදි බලය දෙන ලදී. බලය, දෙන ලද්දේ‡ :———.

ඉල්ලුම්කරුවන්ගේ අත්සන : (1) ———.
(2) ———.
(3) ———.
(4) ———.
(5) ———.
(6) ———.
(7) ———.

---

*මෙම ඉල්ලීම කිරීමට පෙර අවුරුද්දක් ඇතුළතදී පිහිටුවා නො තිබුණ සමිති පිළිබඳව, මෙය කපාහැරිය යුතුවේ.

† ව්‍යවස්ථා යථාභාෂාවෙන් නම්, 32 වෙනි වගන්තියේ 4 වෙනි උපවගන්තියෙන් නියම කරන පරිදි නිවැරදි ඉංග්‍රීසි පරිවර්තනයක් එයට ඇමිණිය යුතුය.

‡ මෙම ඉල්ලීම කිරීමට බලය දෙන ලද්දේ "වෘත්තීය සමිතියෙහි සාමාන්‍ය රැස්වීමකදී කළ යෝජනාවකින්" නම් ඒ බවද, එය දෙනලද්දේ අන් ක්‍රමයකින් නම් ඒ ක්‍රමයද මෙහි

## I වෙනි උපලේඛනය

9 වෙනි වගන්තියේ (2) වෙනි වගන්තියෙහි සඳහන් විස්තර ලේඛනය

(අ) ඉල්ලීම කරන සාමාජිකයින්ගේ නම්, රක්ෂා හා ලිපින මෙහි පහත දක්වෙ.

| (අත්සන්කළෝ) | නම | රක්ෂාව | ලිපින |
|---|---|---|---|
| (1) | | | |
| (2) | | | |
| (3) | | | |
| (4) | | | |
| (5) | | | |
| (6) | | | |
| (7) | | | |

(ආ) (1) මෙම ඉල්ලීම කරන වෘත්තීය සමිතිය ලියා පදිංචි කරනු ලැබීම පිණිස යෝජනා කරන නම :————.

(2) සියලුම දැන්වීම් සහ නිවේදන යැවිය යුතු සමිතියේ ප්‍රධාන කාර්යාලයේ ලිපිනය : ————.

(ඉ) සමිතියේ නිලධාරිනු.

| සමිතියේ දරන ධුරය | නම | වයස | ලිපිනය | රක්ෂාව |
|---|---|---|---|---|
| | | | | |

## II වෙනි උප ලේඛනය

9 වෙනි වගන්තියේ (3) වෙනි උපවගන්තියෙන් වුවමනා වන පවිදි වත්කම හා ණය පිළිබඳ සාමාන්‍ය සටහන

වර්ෂ 19— ක්වූ ———— මස ———— දිනදි ඇතිවූ වත්කම් හා ණය පිළිබඳ සටහනය

| ණය | | රු. ශ | වත්කම | | රු. ශ |
|---|---|---|---|---|---|
| සාමාන්‍ය අරමුදලේ ගණන | ... | | භාණ්ඩාගාරික භාරයේ | ... | |
| දේශපාලන අරමුදලේ ගණන | ... | | ලේකම් තැන භාරයේ | ... | |
| ————ගෙත් ණය | ... | | ————භාරයේ | ... | |
| ————,ට | ... | | ————බැංකුවෙහි | ... | |
| ගෙවිය යුතු ණය වෙනත් ණය (දක්විය යුතුයි) | ... | | ————බැංකුවෙහි | ... | |
| | | | පහත දක්වෙන ලේඛනය අනුව ඇප | ... | |
| | | | නොගෙවන ලද සාමාජික මුදල් | ... | |
| | | | ————ට දෙන ලද ණය | ... | |
| | | | නිශ්චල දේපළ | ... | |
| | | | බඩු සහ ගෘහ භාණ්ඩ | ... | |
| | | | වෙනත් වත්කම් (දක්විය යුතුයි) | ... | |
| මුළු ණය | ... | | මුළු වත්කම | ... | |

ඇප ලේඛනය

| විස්තර | දක්වෙන වටිනාකම | නියම මිල | වෙළඳ වටිනාකම | කවරෙකු භාරයේ යන වග |
|---|---|---|---|---|
| | | | | |

## III වෙනි උපලේඛනය

### ව්‍යවස්ථා හැඳින්වීම

මෙහි පහත 1 වෙනි තීරයෙහි විස්තර ලෙස දක්වෙන කරුණුවලට විධිවිධාන සලස්වන ව්‍යවස්ථාවල අංකය මෙහිම 2 වෙනි තීරයෙහි දක්වන ලදි:—

| 1<br>කාරණය | 2<br>ව්‍යවස්ථා අංකය |
|---|---|
| සමිතියේ නම සහ සමිතියේ කාර්‍ය සඳහා රැස්වෙන ස්ථානය ... | |
| සමිතියෙහි සියලු පරමාර්ථ ... ... ... | |
| සමිතියෙහි සාමාන්‍ය අරමුදල් අදාළ කළ හැකි සියලුම කාර්‍ය ... | |
| සාමාජික නාම ලේඛනයක් තැබීම ... ... ... | |
| නිලධාරීන්ට සහ සාමාජිකයින්ට සාමාජික නාම ලේඛනය පරීක්ෂා කිරීමට සලසා තිබෙන පහසුකම ... ... ... | |
| සමිතියේ රැස්වීම් පැවැත්විය යුතු, වර්තා සටහන් කළයුතු, ස්ථිර කළයුතු සහ ඡන්දය ගතයුතු ක්‍රමය ... ... ... | |
| සාමාන්‍ය සාමාජිකයින් ඇතුළත් කර ගැනීම ... ... | |
| ගරු හෝ තාවකාලික සාමාජිකයින් ඇතුළත් කර ගැනීම ව්‍යවස්ථාවලින් සහතික කරන ලද ප්‍රයෝජන ලබාගැනීම සඳහා පිළිපැදිය යුතු නියම දඩ හෝ අහිමි කිරීම් නියම කිරීමේ හෝ වෙනස් කිරීමේ නියම ... | |
| ව්‍යවස්ථා සෑදිය යුතු, සංශෝධනය කළයුතු, වෙනස් කළ යුතු හෝ අවලංගු කළයුතු ක්‍රමය ... ... ... ... | |
| විධායක මණ්ඩලය, සමිතියේ නිලධාරීන්, පරීක්ෂක තැන හෝ භාරකාරයින් පත්කිරීමේ සහ අස්කිරීමේ ක්‍රමය ... ... | |
| අරමුදල් ආරක්ෂා සහිතව තබා ගැනීම ... ... | |
| වාර්ෂික ගණුදෙනු පරීක්ෂණය ... ... ... | |
| නිලධාරීන්ට සහ සාමාජිකයින්ට ගණුදෙනු පොත් පරීක්ෂා කර බැලීමට ඇති කරන ලද පහසුකම් ... ... ... | |
| සමිතිය විසුරුවා හරින ක්‍රමය සහ විසුරුවා හරින අවස්ථාවෙහි ඇතිවූ අරමුදල් යෙදිය යුතු ක්‍රමය ... | |

### "ඉ" ආකෘතිය

(9 වෙනි වගන්තියේ (3) වෙනි උපවගන්තිය සහ 4 වෙනි නියෝගය)

### වෘත්තීය සමිති පනත

**වත්කම හා ණය පිළිබඳ සාමාන්‍ය සටහන**

වර්ෂ 19— ක්වූ ———— මස ———— දිනදී ඇතිවූ වත්කම හා ණය පිළිබඳ සටහන

| ණය | රු. ශ. | වත්කම | රු. ශ. |
|---|---|---|---|
| සාමාන්‍ය අරමුදලේ ගණන ... | | භාණ්ඩාගාරික භාරයේ ... | |
| දේශපාලන අරමුදලේ ගණන ... | | ලේකම් තැන භාරයේ ... | |
| ———— ගෙන් ණය ... | | ———— භාරයේ ... | |
| ———— ට ගෙවිය යුතු ණය ... | | ———— බැංකුවෙහි ... | |
| වෙනත් ණය (දක්විය යුතුයි) ... | | ———— බැංකුවෙහි ... | |
| | | පහත දක්වෙන ලේඛනය අනුව ඇප ... | |
| | | නොගෙවන ලද සාමාජික මුදල් ... | |
| | | ———— ට දෙන ලද ණය ... | |
| | | නිශ්චල දේපළ ... | |
| | | බඩු සහ ගෘහ භාණ්ඩ ... | |
| | | වෙනත් වත්කම් (දක්විය යුතුයි) ... | |

ඇප ලේඛනය

| විස්තර | දක්වෙන වටිනාකම | නියම මිල | වෙළඳ වටිනාකම | කවරෙකු භාරයේ යන වග |
|---|---|---|---|---|
| | | | | |

"ඊ" ආකෘතිය

(11 වෙනි වගන්තිය සහ 6 වෙනි නියෝගය)

**වෘත්තීය සමිති පනත**

**වෘත්තීය සමිතියක් ලියාපදිංචි කිරීමේ සහතික පත්‍රය**

වෘත්තීය සමිතියෙහි නම. ———.

වෘත්තීය සමිති ලේකම් තැනගේ කාර්යාලය,
කොළඹ.

මෙම ——— දින ——— සමිතිය, වෘත්තීය සමිති පනතෙහි 10 වෙනි වගන්තිය යටතේ ලියා පදිංචි කළ බවට මෙයින් සහතික කරනු ලැබේ. තවද එය ලියා පදිංචි කරන ලද අංකය ——— වේ.

———.
වෘත්තීය සමිති ලේකම් තැන.

ඉහත සඳහන් වෘත්තීය සමිතියෙහි නම ——— යන්නට වෙනස් කළ බවද, 11 වෙනි නියෝගය ප්‍රකාර අළුත් නම වෘත්තීය සමිති ලේඛන පොතෙහි ලියා පදිංචි කළ බවද මෙයින් සහතික කරනු ලැබේ.

———.
වෘත්තීය සමිති ලේකම් තැන.

---

"උ" ආකෘතිය

(15 වෙනි වගන්තියේ (1) වෙනි උපවගන්තිය සහ 7 වෙනි නියෝගය)

**වෘත්තීය සමිති පනත**

**ලියාපදිංචි කිරීමේ සහතික පත්‍රය අස්කර ගැනීමට හෝ අවලංගු කිරීමට ඉල්ලීම**

ලියා පදිංචි කරන ලද වෘත්තීය සමිතියෙහි නම : ———.

ලියා පදිංචි කිරීමේ අංකය : ———.

ප්‍රධාන කාර්යාලයේ ලියාපදිංචි කරන ලද ලිපිනය. ———
19—ක්වූ ——— මස ——— දින දිය.

වෘත්තීය සමිති ලේකම් තැන වෙතටයි, කොළඹ.

වර්ෂ 19—ක්වූ ——— මස ——— වෙනි දින පවත්වන ලද ඉහතකී වෘත්තීය සමිතියෙහි සාමාන්‍ය රැස්වීමකදී* පහත දක්වෙන † යෝජනාව සම්මත කර ගන්නා ලදී ———.

එමනිසා වෘත්තීය සමිති පනත යටතේ වූ එහි ලියා පදිංචි කිරීමේ සහතික පත්‍රය අස්කරන ලෙස/අවලංගු කරන ලෙස අපි මෙයින් ඉල්ලා සිටිමු.

---

* සාමාන්‍ය රැස්වීමකදී නොවූ විට, ඉල්ලීම කිරීමට තීරණය කර ගත් අන්දම සඳහන් කරනු.

† යෝජනාවෙහි නියම පිටපතක් මෙහි දක්වනු.

අංක ——— දරණ ලියා පදිංචි කිරීමේ සහතික පත්‍රය මේ සමග එවා ඇත.

අපි හොඳාකාර දන්නා අන්දමට හා විශ්වාස කරන අන්දමට මෙම ඉල්ලුම් පත්‍රයෙහි ඇතුළත් ප්‍රකාශ සත්‍ය බව මෙයින් සහතික කරමු.

සමිතියේ මුද්‍රාවක් තිබේ නම්, එම මුද්‍රාව

ලේකම්තැනගේ අත්සන: (1) ———.
(2) ———.
(3) ———.
(4) ———.

සාමාජිකයින්ගේ අත්සන: (5) ———.
(6) ———.
(7) ———.
(8) ———.

---

"ඌ" ආකෘතිය

(15 වෙනි වගන්තියේ (2) වෙනි උපවගන්තිය සහ 9 වෙනි නියෝගය)

## වෘත්තීය සමිති පනත

වෘත්තීය සමිති ලේකම් තැනගේ කාර්යාලය,
19—ක්වූ ——— මස ——— වෙනි දින,
කොළඹදීය.

### වෘත්තීය සමිති පනතෙහි 15 වෙනි වගන්තියේ (1) වෙනි උප වගන්තියෙහි (ආ) ඡේදය යටතේ ලියා පදිංචි කිරීමේ සහතික පත්‍රය අස් කිරීමට හෝ අවලංගු කිරීමට පෙර යවන දැන්වීම

වෘත්තීය සමිතියේ නම : ———.
ලියා පදිංචි කිරීමේ අංකය : ———.

* වර්ෂ 19 —ක්වූ ——— මස ——— දිනයේදී ඉහතකී වෘත්තීය සමිතිය ලියා පදිංචි කිරීමේ සහතික පත්‍රය, ඒ අතරතුර එම විරුද්ධව කරුණු නො දක්වූවහොත්, අස් කිරීමට/අවලංගු කිරීමට වෘත්තීය සමිති ලේකම් තැන අදහස් කර සිටින බව, වෘත්තීය සමිති පනතෙහි 15 වෙනි වගන්තියේ (2) වෙනි උපවගන්තිය යටතේ, එකී වෘත්තීය සමිතිය වෙත මෙයින් දන්වනු ලැබේ.

එසේ අදහස් කරන අස්කර ගැනීම/අවලංගු කිරීම කරනු ලබන්නේ [පහත දක්වෙන කරුණක් උඩය:—

(i) ලියා පදිංචි කිරීමේ සහතික පත්‍රය ප්‍රයෝගයකින් ලබා ගැනීම හෝ වැරදීමකින් ලැබීම;
(ii) වෘත්තීය සමිතියෙහි පරමාර්ථයන්ගෙන් හෝ ව්‍යවස්ථාවන්ගෙන් කිසිවක් නීති විරෝධී වීම;
(iii) වෘත්තීය සමිතිය පිහිටුවීම හෝ එහි විධායක මණ්ඩලය නීතිවිරෝධී වීම;
(iv) වෘත්තීය සමිතිය හිතාමතාම, වෘත්තීය සමිති ලේකම් තැනගෙන් දැන්වීමක් ලැබී තිබියදීත් මෙම පනතෙහි විධිවිධානවලට විරුද්ධව කටයුතු කිරීම හෝ එබඳු විධිවිධානවලට විරුද්ධවූ ව්‍යවස්ථාවක් බලපැවැත්වීමට ඉඩහැරීම හෝ 32 වෙනි වගන්තිය යටතේ විධිවිධාන සැලසිය යුතු කරුණකට වූ ව්‍යවස්ථාවක් අවලංගු කිරීම;
(v) වෘත්තීය සමිතියෙහි අරමුදල් නීතිවිරෝධී ලෙය වියදම් කිරීම හෝ නීතිවිරෝධී පරමාර්ථයකට වියදම් කිරීම හෝ සමිතියෙහි ව්‍යවස්ථාවන්ගෙන් බලය නොලත් පරමාර්ථයකට වියදම් කිරීම ; නැතහොත්
(vi) වෘත්තීය සමිතිය අභාවයට ගොස් තිබීමද වේ.

† ............................................................
............................................................

———,
වෘත්තීය සමිති ලේකම් තැන.

———,
(වෘත්තීය සමිතියේ නම යොදනු)
ලේකම් තැන.

වෘත්තීය සමිතියේ ප්‍රධාන කාර්යාලයේ ලියා පදිංචි කරන ලද ලිපිනය : ———.

---

* මෙහි ඇතුළත් කරන දිනය දැන්වීම දුන් දිනය සිට මාස දෙකකට අඩු නොවිය යුතුයි.
† [illegible]

### "ඩී" ආකෘතිය

(29 වෙනි වගන්තියේ (2) වෙනි උපවගන්තිය සහ 11 වෙනි නියෝගය)

### වෘත්තීය සමිති පනත

### නම වෙනස් කිරීමේ දැන්වීම

ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියෙහි නම : ———.

ලියා පදිංචි කිරීමේ අංකය : ———.

ප්‍රධාන කාර්යාලයේ ලියාපදිංචි කරන ලද ලිපිනය : ———.

වර්ෂ 19— ක්වූ ———මස——දින දිය.

වෘත්තීය සමිති ලේකම් තැන, කොළඹ.

ඉහත සඳහන් සමිතියේ නම——— යන්නට වෙනස් කළ බව, වෘත්තීය සමිති පනතෙහි 29 වෙනි වගන්තියේ (1) වෙනි උපවගන්තිය ප්‍රකාර, මෙයින් දැනුම් දෙනු ලැබේ.

සාමාජිකයින්ගේ කැමැත්ත ලබා ගන්නා ලද්දේ* : ———.

අංක ———දරණ ලියා පදිංචි කිරීමේ සහතික පත්‍රය අවශ්‍ය සංශෝධන සමග මේ සමග එවා ඇත.

ලේකම් තැනගේ අත්සන : (1) ———.

(2) ———.

(3) ———.

(4) ———.

සාමාජිකයින්ගේ අත්සන : (5) ———.

(6) ———.

(7) ———.

(8) ———.

---

*එනම්, ඡන්දය විමසීමක් සාමාන්‍ය රැස්වීමක යෝජනාවක් ආදියෙන් අනුගමනය කළ ක්‍රියා මාර්ගය ව්‍යවස්ථාවක් අනුව නම් ඒ ව්‍යවස්ථාවේ අංකය දක්වනු.

---

### "ඊ" ආකෘතිය

(29 වෙනි වගන්තියේ (1) වෙනි උපවගන්තිය සහ 12 වෙනි නියෝගයේ (1) වෙනි ඡේදය)

### වෘත්තීය සමිති පනත

### වෘත්තීය සමිති ඒකාබද්ධ කිරීමේ දැන්වීම

(අ) ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියෙහි නම: ———.

ලියා පදිංචි කිරීමේ අංකය : ———.

(ආ) ලියා පදිංචි කරන ලද වෘත්තීය සමිතියෙහි නම : ———.

ලියා පදිංචි කිරීමේ අංකය : ———.

(දෙකකට වැඩි නම් මේ ආකාරයටම යොදනු)

ලිපිනය : ———.

වර්ෂ 19— ක්වූ ———මස——දින දිය.

වෘත්තීය සමිති ලේකම් තැන වෙතටයි, කොළඹ.

ඉහත සඳහන් වෘත්තීය සමිතිවල සෑම සාමාජිකයෙක්ම, එකම වෘත්තීය සමිතියක් සේ ඒකාබද්ධවීමට තීරණය කර ගත් බැව්, ඉහතකී පනතෙහි 29 වෙනි වගන්තියේ (1) වෙනි උපවගන්තියෙන් වුවමනා වන ප්‍රකාර, මෙයින් දැනුම් දෙනු ලැබේ.

2. එකී ඒකාබද්ධ කිරීමේ නියම පහත දක්වනු ලැබේ : ———.

3. මින් පසු ඒකාබද්ධ වෘත්තීය සමිතිය———යන නමින් හැඳින්වීමට අදහස් කරනු ලැබේ.

4. [illegible]

5. වෘත්තීය සමිතිවල සාමාජිකයින්ගේ කැමැත්ත ලබා ගන්නේ * : ———.

6. ———සමිතියෙහි ව්‍යවස්ථාවන් වන (එය එසේ නම්) මින්පසු ඒකාබද්ධ වෘත්තීය සමිතිය විසින් පිළිගැනීමට අදහස් කොට තිබෙන, ව්‍යවස්ථාවල පිටපතක් මෙම දැන්වීම සමග ඇත.

ලේකම් තැනගේ අත්සන † : (1) ———.

(2) ———.

(3) ———.

(4) ———.

සාමාජිකයින්ගේ අත්සන : (5) ———.

(6) ———.

(7) ———.

(8) ———.

---

*එනම්, ඡන්දය විමසීමක් සාමාන්‍ය රැස්වීමක යෝජනාවක් ආදියෙන් අනුගමනය කළ ක්‍රියා මාර්ගය ව්‍යවස්ථාවක් අනුව නම් ඒ ව්‍යවස්ථාවේ අංකය දක්වනු.

†සාමාජිකයින් සත්දෙනෙක්ද එක් එක් වෘත්තීය සමිතියේ ලේකම් තැනද මෙහි අත්සන් කළ යුතුය.

---

සැලකිය යුතුයි.—සමිතිය විසුරුවා හැර 14 දිනක් ඇතුළත මේ දැන්වීම යැවිය යුතුයි.

"ඔ" ආකෘතිය

(34 වෙනි වගන්තිය සහ 13 වෙනි නියෝගය)

වෘත්තීය සමිති පනත

වෘත්තීය සමිතියක් විසුරුවා හැරීමේ දැන්වීම

ලියා පදිංචි කරන ලද වෘත්තීය සමිතියෙහි නම : ———.

ලියා පදිංචි කිරීමේ අංකය : ———.

ප්‍රධාන කාර්‍යාලයේ ලියාපදිංචි කරන ලද ලිපිනය : ———.

වර්ෂ 19—— ක්වූ ——— මස —— දින දිය.

වෘත්තීය සමිති ලේකම් තැන වෙතටයි, කොළඹ.

ඉහතකී වෘත්තීය සමිතිය, එහි ව්‍යවස්ථාවන් ප්‍රකාර වර්ෂ 19—— ක්වූ ———මස වෙනි දින විසුරුවා හරින ලද බැව් මෙයින් දන්වා දෙනු ලැබේ. ‡ වර්ෂ 19——ක්වූ———මස ——වෙනි දින පවත්වන ලද සාමාන්‍ය රැස්වීමකදී සම්මතවූ යෝජනාවකින් එම වෘත්තීය සමිතිය විසින් මෙම දැන්වීම දීමට යථා පරිදි අපට බලය දෙන ලදී.

අංක———දරණ ලියා පදිංචි කිරීමේ සහතික පත්‍රය මේ සමග එවා ඇත.

ලේකම් තැනගේ අත්සන : (1) ———.

(2) ———.

(3) ———.

(4) ———.

සාමාජිකයින්ගේ අත්සන : (5) ———.

(6) ———.

(7) ———.

(8) ———.

---

[illegible]

"ඔ" ආකෘතිය

(31 වෙනි වගන්තියේ (2) වෙනි උපවගන්තිය සහ 1(උ) වෙනි නියෝගය)

**වෘත්තිය සමිති පනත**

**ලියාපදිංචි කරන ලද වෘත්තිය සමිතියක කාර්යාලය වෙනස් කිරීමේ දන්වීම**

ලියාපදිංචි කරන වෘත්තිය සමිතියෙහි නම : ———.

ලියාපදිංචි කිරීමේ අංකය : ———.

වර්ෂ 19——ක්වූ————මස——වෙනි දින දිය.

වෘත්තිය සමිති ලේකම් තැන වෙතටයි, කොළඹ.

ඉහත සඳහන් වෘත්තිය සමිතියේ ප්‍රධාන කාර්යාලය————යන ස්ථානයෙන් ගෙන ගිය බව හා දනට————ගි————යන ස්ථානයෙහි පිහිටුවා තිබෙන බවද මෙයින් දනුම් දෙනු ලැබේ.

.............................................

ලේකම් තැනගේ අත්සන.

---

දන්වීම ලියාපදිංචි කරන විට මේ කොටස වෘත්තිය සමිති ලේකම් තැන විසින් වෙන්කොට වෘත්තිය සමිතියට තැපැල් භාරදිය යුතුයි.

ලියා පදිංචි කිරීමේ අංකය——— වන වෘත්තිය සමිතියේ ලියා පදිංචි කරන ලද කාර්යාලය———— ට ගෙනයාමේ දන්වීම වර්ෂ 19— ක්වූ මස——වෙනි දින ලැබී තිබේ.

.............................................

වෘත්තිය සමිති ලේකම්තැනගේ අත්සන.

---

සැලකිය යුතුයි.—අළුත් ව්‍යවස්ථා සෑදීමෙන් හෝ ව්‍යවස්ථා වෙනස් කිරීමෙන් හෝ දින හතක් ඇතුළත, ලියා පදිංචි කරන ලද වෘත්තිය සමිතියේ ලේකම් තැන විසින් මෙම ඉල්ලුම් පත්‍රය වෘත්තිය සමිති ලේකම් තැනට යැවිය යුතුය.

"ක" ආකෘතිය

(32වෙනි වගන්තිය සහ 15වෙනි නියෝගය)

වෘත්තිය සමිති පනත

| |
|---|
| ශත 25 මුද්දරය. අවලංගු නො කළ යුතුය. |

ලියාපදිංචි කරන ලද වෘත්තිය සමිතියේ නම : ———.

ලියාපදිංචි කිරීමේ අංකය : ———.

ප්‍රධාන කාර්යාලයේ ලියාපදිංචි කරන ලද ලිපිනය : ———.

වර්ෂ 19——ක්වූ————මස——වෙනි දිනදිය.

**වෘත්තිය සමිති ලේකම්තැන වෙතය, කොළඹ.**

**අළුත් ව්‍යවස්ථා හෝ ව්‍යවස්ථා වෙනස් කිරීමේ ලියාපදිංචි කිරීමේ ඉල්ලුම් පත්‍රය.**

ඉහත සඳහන් වෘත්තිය සමිතියේ ලේකම් වන, මෙහි පහත අත්සන් කරන මම, මේ සමග මුද්‍රිත ලියන ලද පිටපත් දෙකක් එවා ඇත. අළුත් ව්‍යවස්ථාව/ව්‍යවස්ථා සමිතියේ ව්‍යවස්ථා වෙනස් කිරීම/වෙනස් කිරීම් ලියාපදිංචි කරන ලෙස ඉල්ලා සිටිමි.

2. තවද, වෙනස් කළ ස්ථාන හා වෙනස් කළ පිළිවෙළද පෙන්වමින් ලකුණු කරන ලද, ලියාපදිංචි කරනු ලැබූ ව්‍යවස්ථාවන්හි මුද්‍රිත පිටපතක් මේ සමග අමුණා ඇත.

3. *වර්ෂ 19——ක්වූ————මස——වෙනි දින පවත්වන ලද සාමාන්‍ය රැස්වීමකදී සම්මත කරගත් යෝජනාවකින් වෘත්තිය සමිතිය වෙනුවෙන් මෙම ඉල්ලීම කිරීමට, එම සමිතිය විසින් මට යථා පරිදි බලය දෙන ලදි.

4. අළුත් ව්‍යවස්ථාව/ව්‍යවස්ථා සෑදීමේදී සහ වෙනස් කිරීමකදී/වෙනස් කිරීම්වලදී වෘත්තිය සමිතියෙහි දන් පවත්නා ව්‍යවස්ථාවන් අනුගමනය කළ බව මම ප්‍රකාශ කරමි.

5. ශත 25ක වටිනාකමැති අවලංගු නොකරන ලද මුද්දරයක්/මුද්දර මේ ඉල්ලුම් පත්‍රයට අමුනා ඇත.

.............................................

ලේකම්තැනගේ අත්සන.

---

*මෙහි දිනය යොදනු. නැතහොත් එබදු යෝජනාවක් නොවී නම් බලය ලබා ගත් ක්‍රමය සඳහන් කරන.

සැලකිය යුතුයි.—නිලධාරීන් වෙනස්වී හෝ යම්කිසි නිලධාරියෙකුගේ ධුර නාමය වෙනස්වී 7 දවසක් ඇතුළත ලියාපදිංචි කරන ලද වෘත්තීය සමිතියේ ලේකම් තැන විසින් මෙම ඉල්ලුම් පත්‍රය වෘත්තීය සමිති ලේකම් තැන වෙත යැවිය යුතුය.

"ග" ආකෘතිය

(32 වෙනි වගන්තිය සහ 16 වෙනි නියෝගය)

වෘත්තීය සමිති පනත

| |
|---|
| ශත 10 මුද්දරය අවලංගු කළ යුතු නොවේ. |

නිලධාරීන් වෙනස්වීමේ හෝ යම්කිසි නිලධාරියෙකු ගේ ධුර නාමය වෙනස්වීමේ හෝ දන්වීම

ලියා පදිංචි කරන ලද වෘත්තීය සමිතියේ නම : ———.

ලියාපදිංචි කිරීමේ අංකය : ———.

ප්‍රධාන කාර්යාලයේ ලියාපදිංචි කරන ලද ලිපිනය : ———.

වර්ෂ 19—ක්වූ ——— මස ——— වෙනි දිනදීය.

වෘත්තීය සමිති ලේකම් තැන වෙතටයි, කොළඹ.

පහත දක්වෙන නිලධාරීන්ගේ වෙනස්වීම් සිදු වූ බව මෙයින් දන්වනු ලැබේ :—

ධුරය අත් හරින නිලධාරීහු

| නම | ධුර නාමය | ධුරය අත්හැරි දිනය |
|---|---|---|
| | | |

පත්.කරන ලද නිලධාරීහු

| ධුර නාමය | නම | වයස | ලිපිනය | රක්ෂාව | පත් කළ දිනය |
|---|---|---|---|---|---|
| | | | | | |

2. * නිලධාරීන්ගේ ධුර නාම සම්බන්ධයෙන් පහත දක්වෙන වෙනස් වීම් සිදුවී ඇත්තේය :— ———.

3. †වර්ෂ 19—ක්වූ ——— මස ——— වෙනි දින පවත්වන ලද සාමාන්‍ය රැස්වීමක දී සම්මත කර ගත් යෝජනාවකින් වෘත්තීය සමිතිය වෙනුවෙන් මෙම ඉල්ලීම කිරීමට එම සමිතිය විසින් යථාපරිදි මට බලය දෙන ලදී.

4. ශත 10ක වටිනාකමැති අවලංගු නොකරන ලද මුද්දරයක්/මුද්දර මෙම ඉල්ලුම් පත්‍රයට අමුනා ඇත.

.....................................

ලේකම් තැනගේ අත්සන.

*ධුර නාම වෙනස් වීමක් නොමැති වී නම් මේය අත් හරිනු.

†මෙහි දින දක්වනු. නැත හොත් එබඳු යෝජනාවක් නොවී නම් බලය ලබා ගත් ක්‍රමය

"ජ" ආකෘතිය

(13වෙනි වගන්තිය සහ 17වෙනි නියෝගය)

භාණ්ඩාගාරික තැන විසින් හෝ වෘත්තීය සමිතියක ගණුදෙනු භාර වෙනත් නිලධාරියෙකු විසින් තැබිය යුතු ගණුදෙනු ආකෘතිය

අය වැය ලේඛනය

| අය | රු. ශ. | වැය | රු. ශ. |
|---|---|---|---|
| අවුරුද්ද ඇරඹෙද්දී ඉතිරි මුදල ... | | වේතන, දීමනා සහ නිලධාරීන්ගේ වියදම් ... ... | |
| සාමාජිකයකුගෙන් ... | | | |
| [illegible] සාමාජිකයන්ගේ සාමාජික මුදල් ... | | වේතන, දීමනා සහ කාර්යාලීය වියදම් ... ... | |
| ආධාර මුදල් ... | | පරීක්ෂක තැනගේ ගාස්තු ... | |
| (ආ). සභා, පොත්, ව්‍යවස්ථා ආදිය විකිණීමෙන් ලැබූ මුදල් | | නඩු කටයුතු පිළිබඳ වියදම් ... | |
| මුදල් දියුණුවට යෙදීම්වලින් [illegible] පොලිය ... | | කම්කරු ආරාවුල්, පවත්වාගෙන යාමේ වියදම් ... | |
| වෙනත් විවිධ මාර්ගවලින් ලැබූ ආදායම් (එම මාර්ග සඳහන් කළ යුතුයි) ... | | කම්කරු ආරාවුල් නිසා සාමාජිකයින්ට ඇතිවන අලාභයන්ට ගෙවන ලද වන්දි ... | |
| | | මරණ, මහළු වයස, රෝගී බව, රක්ෂා විරහිත බව ආදිය පිළිබඳ ව ආධාර ... ... | |
| | | අධ්‍යාපනික, සාමාජික සහ ආගමික ආධාර ... ... | |
| | | සභාරා ප්‍රසිද්ධ කිරීමේ වියදම් ... | |
| | | කුලී මුදල්, අයබදු සහ වරිපනම් ... | |
| | | ලිපිද්‍රව්‍ය, මුද්‍රණ කටයුතුවලට වියදම් හා තැපැල් ගාස්තු ... | |
| | | වෙනත් වියදම් (මෙහි සඳහන් කළ යුතුයි) ... ... | |
| | | අවුරුද්ද අවසානයේදී ඉතිරි මුදල | |
| මුළු එකතුව ... | | මුළු වත්කම ... | |

.........................................

භාණ්ඩාගාරික තැනගේ අත්සන.

දේශපාලන අරමුදල

| | රු. ශ. | | රු. ශ. |
|---|---|---|---|
| [illegible] | | වෘත්තීය සමිති පනතෙහි 41 වන වගන්තියේ (2) වෙනි උප වගන්තියෙහි දක්වෙන පරමාර්ථයන් සඳහා ගෙවීම් (ඒවා සඳහන් කළ යුතුයි) ... | |
| | | පාලනය කිරීමේ වියදම් (සම්පූර්ණයෙන්ම මෙහි දක්විය යුතුය) ... | |
| | | අවුරුද්ද අවසානයෙහි ඉතිරි මුදල | |
| [illegible] | | එකතුව ... | |

.........................................

වර්ෂ 19—ක්වූ මාර්තු මස 31වෙනි දිනට හෝ ——— *දිනට වත්කම හා ණය ලේඛනය

| ණය | රු. ශ. | වත්කම | රු. ශ. |
|---|---|---|---|
| සාමාන්‍ය අරමුදලෙහි ප්‍රමාණය | | මුදල්— | |
| දේශපාලන අරමුදලෙහි ප්‍රමාණය ... ... | | භාණ්ඩාගාරික තැන භාරයේ ——— | |
| ——— ගෙන් ගත් ණය ... | | ලේකම් තැන භාරයේ ... | |
| ———ට ගෙවිය යුතු ණය | | ——— භාරයේ ... | |
| වෙනත් ණය (මෙහි සඳහන් කළ යුතුයි) ... | | ——— බැංකුවෙහි ... | |
| | | ——— බැංකුවෙහි ... | |
| | | පහත දක්වෙන ලේඛනය අනුව ඇප ... ... | |
| | | නොගෙවා හිඟව තිබෙන සාමාජික මුදල් ... ... | |
| | | ———ට දෙන ලද ණය ... | |
| | | නිශ්චලදේපල ... | |
| | | බඩු සහ ලිඛඩු ... | |
| | | වෙනත් වත්කම් (මෙහි සඳහන් කළ යුතුය) ... | |
| මුළු ණය ... | | මුළු වත්කම ... | |

ඇප ලේඛනය

| විස්තර | දක්වෙන වටිනාකම | නියම මිල | ගණුදෙනු සම්පූර්ණ කරන ලද දිනයෙහි වෙළඳ වටිනාකම | කවරෙකු භාරයේද යන වග |
|---|---|---|---|---|
| | | | | |

——— වෘත්තීය සමිතියේ† භාණ්ඩාගාරික තැන / ගණුදෙනු භාර නිලධාරියා වන මම ඉහත දක්වෙන සමිතියෙහි ගණුදෙනු ලේඛනය මා හොඳාකාර දන්නා අඳුමට හා විශ්වාස කරන අඳුමට සත්‍ය බව හා නිවැරදි බව† දිවුරා ප්‍රකාශ කරමි / ගාම්භීරතාපූර්වකව, අවංක ලෙස හා සත්‍ය ලෙස සහතික කොට ප්‍රකාශ කරමි.

මා විසින් අත්සන් කරන ලද්දේ මෙම වර්ෂ 19—ක්වූ ——— මස ——— වෙනි දි.' දිය.

.......................................................

භාණ්ඩාගාරිකතැනගේ/ගණුදෙනු භාර නිලධාරියාගේ අත්සන.

මා ඉදිරිපිට† දිවුරන ලද්දේ / සහතික කරන ලද්දේ මෙම වර්ෂ 19—ක්වූ——— මස——— වෙනි දින දිය.

.......................................

සමාදාන විනිශ්චයකාරතැනගේ අත්සන.

සැලකිය යුතුයි.—මෙම දිවුරුම් පෙත්සම නියමිත මුද්දර ගාස්තුවට යටත්වය.

*පනතෙහි 44 වෙනි වගන්තියෙහි(3) වෙනි උප වගන්තිය යටතේ අනුමත කරන ලද දිනයක් වෙනොත් ඒ දිනය යොදනු.

† [illegible]

[redacted]

## " ට " ආකෘතිය

### වෘත්තීය සමිති පනතෙහි 44 වෙනි වගන්තිය සහ 18 වෙනි නියෝගය යටතේ නියමිත 19——ක්වූ මාර්තු මස 31 වෙනි දිනට හෝ වෘත්තීය සමිති ලේකම් තැන විසින් අනුමත කරන වෙනත් දිනයක* අවසන් වන අවුරුද්දෙහි වාර්ෂික වාර්තාව

ලියාපදිංචිකරන ලද සමිතියෙහි නම : ————.

ලියාපදිංචි කිරීමේ සහතික පත්‍රයෙහි අංකය:————.

ලියාපදිංචි කරන ලද ප්‍රධාන කාර්යාලයෙහි ලිපිනය:————.

වාර්තාව සපයන්නේ කිනම් වර්ෂය සඳහාද?————.

---

* වෘත්තීය සමිති පනතෙහි 44 වෙනි වගන්තියේ (3) වෙනි උප වගන්තිය යටතේ අනුමත කරන ලද දිනය.

---

†1. (අ) * අවුරුද්ද පටන් ගැනීමට ප්‍රථමයෙන් ඒකාබද්ධ කරන ලද වෘත්තීය සමිතිවල ගණන ... ...

(ආ) * අවුරුද්ද ඇතුළතදී බැඳුණු සමිති ගණන ... ...

(ඉ) * අවුරුද්ද ඇතුළතදී අස්ව ගිය සමිතිවල ගණන ...

අවුරුද්ද අවසානයේදී ඒකාබද්ධ කරන ලද සමිතිවල මුළු ගණන ... ... ...

---

‡2. අවුරුද්ද මුලදී පොත්වල සඳහන් සාමාජිකයින්ගේ ගණන ...

අවුරුද්ද ඇතුළත, ඇතුළත් කරගත් සාමාජිකයින්ගේ ගණන

අවුරුද්ද ඇතුළත අස්ව ගිය සාමාජිකයින්ගේ ගණන ...

අවුරුද්ද අවසානයේදී පොත්වල සඳහන් සාමාජිකයින්ගේ මුළු ගණන—පිරිමි, ගැහැණු ... ... ...

දේශපාලන අරමුදලට ආධාර කරන සාමාජිකයින්ගේ ගණන ...

---

3. නියමිත ප්‍රකාරයට වර්ෂ 19—ක්වූ මාර්තු මස 31 වෙනි දිනට හෝ§————දිනට අවසන් වන දොළොස් මාසය ඇතුළත අය වැය පිළිබඳව සහ එම දිනට වත්කම හා ණය පිළිබඳව සාමාන්‍ය ලේඛනයක් පරීක්ෂකතැනගේ වාර්තාවත් සමගම " ඊ " ලේඛනයේ අමුණා ඇත.

---

4. මෙම වාර්තාව යවන දිනය තෙක් නිවැරදි කරන ලද, වෘත්තීය සමිතියෙහි ව්‍යවස්ථාවල පිටපතක්ද අවුරුද්ද ඇතුළත ව්‍යවස්ථා සම්බන්ධයෙන් කරන ලද සියලුම වෙනස් කිරීම්වල හෝ සංශෝධනයන්හි සහ සම්මත කරන ලද අළුත් ව්‍යවස්ථාවන්හි පිටපතක්ද මේ සමග අමුනා ඇත.

---

5. අවුරුද්ද ඇතුළතවූ නිලධාරින්ගේ සියලුම වෙනස්වීම් පිළිබඳ ලේඛනය " උ " ලේඛනයේ අමුනා ඇත.

..........................

ලේකම් තැනගේ අත්සන.

වර්ෂ 19--ක්වූ ———— මස ———— වෙනි දිනදිය

---

*මෙම තොරතුරු සැපයිය යුත්තේ ඒකාබද්ධ කරන ලද වෘත්තීය සමිති විසිනි.

†වෘත්තීය සමිතිවල නම්, " අ ", " ආ " සහ " ඉ " යන ආකාරයෙන් ලකුණු කොට වෙන් වශයෙන් සැපයිය යුතුය.

‡ඒකාබද්ධ කරන ලද වෘත්තීය සමිති විසින් මේ තොරතුරු සැපයීම වුවමනා නොවේ.

§වෘත්තීය සමිති පනතෙහි 44 වෙනි වගන්තියේ (3) වෙනි උපවගන්තියෙන් අනුමත [illegible]

## "ඊ" ලේඛනය

### (i) අයවැය ලේඛනය

| අය | රු. ශ. | වැය | රු. ශ. |
|---|---|---|---|
| අවුරුද්ද මුලදී ඉතිරි මුදල ... | | වේතන, දීමනා සහ නිලධාරීන්ගේ වියදම් ... | |
| සාමාජිකයෙකුගෙන් ——— බැගින් සාමාජිකයින්ගේ සාමාජික මුදල් ... | | වේතන දීමනා සහ කාර්යාලීය වියදම් ... ... | |
| පත්‍ර, සඟරා, පොත්, ව්‍යවස්ථා ආදිය විකිණීමෙන් ලැබූ මුදල් ... | | පරීක්ෂකතැනගේ ගාස්තුව ... | |
| මුදල් දියුණුවට යෙදවීම්වලින් ලැබූ පොලිය ... ... | | නඩු කටයුතු පිළිබඳ වියදම් ... | |
| වෙනත් විවිධ මාර්ගවලින් ලැබූ ආදායම් (එම මාර්ග සඳහන් කළ යුතුයි) | | කම්කරු ආරාවුල් මෙහෙයවීමේ වියදම් ... ... | |
| | | කම්කරු ආරාවුල් නිසා සාමාජිකයන්ට ඇතිවන අලාභයන්ට ගෙවන ලද වන්දි ... | |
| | | මරණ, මහලු වයස, රෝගී බව, රක්ෂා විරහිත බව ආදිය පිළිබඳව ආධාර ... | |
| | | අධ්‍යාපනික, සාමාජික සහ ආගමික ආධාර ... | |
| | | සඟරාවන් ප්‍රසිද්ධ කිරීමේ වියදම් ... ... | |
| | | කුලී මුදල්, අයබදු හා වරිපනම් | |
| | | ලිපිද්‍රව්‍ය, මුද්‍රණ කටයුතුවලට වියදම් හා තැපැල් ගාස්තු වෙනත් වියදම් (මෙහි සඳහන් කළ යුතුයි) ... | |
| | | අවුරුද්ද අවසානයේදී ඉතිරි මුදල ... ... | |
| එකතුව ... | | එකතුව ... | |

..........................................

භාණ්ඩාගාරික තැනගේ අත්සන.

### (ii) දේශපාලන අරමුදල

| | රු. ශ. | | රු. ශ. |
|---|---|---|---|
| අවුරුද්ද මුලදී ඉතිරි මුදල ... | | ව්‍යවස්ථාපිත සමිති පනතෙහි 41 වන වගන්තියේ (2) වන උප වගන්තියෙහි දක්වෙන පරමාර්ථයන් සඳහා ගෙවීම් (ඒවා සඳහන් කළ යුතුයි) ... | |
| සාමාජික මුදල සාමාජිකයෙකුගෙන් ——— ගණනේ සාමාජිකයින්ගෙන් ලත් සාමාජික මුදල් ... | | පාලනය කිරීමේ වියදම් (සම්පූර්ණයෙන්ම මෙහි දක්විය යුතුය) ... ... | |
| | | අවුරුද්ද අවසානයෙහි ඉතිරි මුදල ... ... | |
| එකතුව ... | | එකතුව ... | |

............. .........................

(iii) වර්ෂ 19—ක්වූ මාර්තු මස 31 වෙනි දිනට
හෝ ———— * දිනට වත්කම හා
ණය ලේඛනය

| ණය | රු. ශ. | වත්කම | රු. ශ. |
|---|---|---|---|
| සාමාන්‍ය අරමුදලෙහි ප්‍රමාණය ... | | මුදල්— | |
| දේශපාලන අරමුදලෙහි ප්‍රමාණය ... | | භාණ්ඩාගාරික තැන භාරයේ | |
| ———— ගෙන් ගත් ණය ... | | ලේකම්තැන භාරයේ ... | |
| ———— ට ගෙවිය යුතු ණය ... | | ———— භාරයේ ... | |
| වෙනත් ණය (මෙහි සඳහන් කළ යුතුය) | | ———— බැංකුවෙහි ... | |
| | | ———— බැංකුවෙහි ... | |
| | | පහත දක්වෙන ලේඛනය අනුව ඇප ... | |
| | | නොගෙවන ලද හිඟ සාමාජික මුදල් ... | |
| | | ———ට දෙන ලද ණය | |
| | | නිශ්චල දේපළ ... | |
| | | බඩු.භා ලි බඩු ... | |
| | | වෙනත් වත්කම් (මෙහි සඳහන් කළ යුතුය) ... | |
| මුළු ණය ... | | මුළු වත්කම ... | |

ඇප ලේඛනය

| විස්තර | දක්වෙන වටිනාකම | නියම මිල | ගණුදෙනු සම්පූර්ණ කරන ලද දිනයෙහි වෙළඳ වටිනාකම | කවරෙකු භාරයේද යන වග |
|---|---|---|---|---|
| | | | | |

———— වෘත්තීය සමිතියෙහි† ————(භාණ්ඩාගාරික තැන / ගණුදෙනු භාර නිලධාරියා)———— වන

මම ඉහත දක්වෙන සමිතියෙහි ගණුදෙනු ලේඛනය මා හොඳාකාර දන්නා හැටියටද විශ්වාස කරන හැටියටද සත්‍ය බව හා නිවැරදි බව† ————(දිවුරා ප්‍රකාශ / ගාම්භීරතාපූර්වකව, අවංක ලෙස හා සත්‍ය ලෙස)———— කරමි / සහතික කොට ප්‍රකාශ කරමි.

මා විසින් අත්සන් කරන ලද්දේ මෙම වර්ෂ 19—ක්වූ ———— මස ———— වෙනි දින දිය.

..........................................................
භාණ්ඩාගාරිකතැනගේ/ගණුදෙනු භාර නිලධාරියාගේ අත්සන.

මා ඉදිරිපිට† ————(දිවුරන ලද්දේ / සහතික කරන ලද්දේ)———— මෙම වර්ෂ 19—ක්වූ ———— මස ———— වෙනි දින දිය.

..........................................................
සමාදාන විනිශ්චයකාරතැනගේ අත්සන

සැලකිය යුතුයි.—මෙම දිවුරුම් පෙත්සම නියමිත මුද්දර ගාස්තුවට යටත්ය.

*පනතෙහි 44 වෙනි වගන්තියේ (3) වෙනි උපවගන්තිය යටතේ අනුමත කරන ලද දිනයක් වේනම් ඒ දිනය යොදනු.
† වුවමනා නැති වචන කපා හරිනු

[illegible]

ලියාපදිංචි කිරීමේ අංකය :————.

මෙහි පහත අත්සන් කරන අය විසින් වෘත්තීය සමිතියේ සියලුම පොත් සහ ගණුදෙනු ලේඛන කියවා බලා, ඉහත දක්වූ ලේඛන ඒ සම්බන්ධයෙන්වූ වැය සහතික සමග පරීක්ෂා [illegible], ඒවා නිවැරදි බවටද, නිසි ආකාර ස්ථිරවූ බවටද, නීත්‍යානුකූල බවටද පහත දැක්වෙන ප්‍රකාශවලට පමණක් යටත්ව,* දැන් මෙයට අත්සන් තබන්ට යෙදුනා ඇත.

පරීක්ෂකවරුන්ගේ අත්සන : ............

............

---

## “උ” ලේඛනය

### අවුරුද්ද ඇතුළතවූ නිලධාරීන්ගේ වෙනස්වීම

(i) ධුරය අත්හරින ලද නිලධාරීහු

| නම | ධුර නාමය | ධුරය අත්හැරි දිනය |
|---|---|---|
| | | |

පත් කරන ලද නිලධාරීහු

| නම | උපන් දිනය | පුද්ගලික ලිපිනය | පුද්ගලික රක්ෂාව | සමිතියේ දරන ධුර නාමය | වර්තමාන ධුරයෙහි වූ පත්වීම භාර ගත් දිනය |
|---|---|---|---|---|---|
| 1 | 2 | 3 | 4 | 5 | 6 |
| | | | | | |

.................................

ලේකම් තැනගේ අත්සන.

*20 වෙනි නියෝගය බලනු.